
# පැංචා



ඔනේත්‍රා නානායක්කාර

කෘතියේ නම : පැංචා
කතාව හා චිත්‍ර :ඔනේත්‍රා නානායක්කාර
කතෘගේ ලිපිනය : අංක 102/50,හේවාහැට පාර, තල්වත්ත
කතෘගේ වෙනත් කෘති : ආඩම්බර මොනරා

---

© ඔනේත්‍රා නානායක්කාර
මහාමායා බාලිකා විදුහල
3 ශ්‍රේණිය A
2025.02.08

ISBN 978 - 624 - 208 - 489- 3

# පිදුම

උතුම්

ගති පැවතුම් ඇති

මාගේ ආදරණීය දෙමාපියන්ට,ගුරුමවුවරු

පියවරුන්ට හා

ආදරණීය යෙහෙළියන්ට

මේ පොත් පිංච

ආදරයෙන් පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. පිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර.

එකමත් එක කැළෑවක පුංචි වලස් පවුලක් ජීවත් වුණා.ඒ පවුලේ හිටියේ වලස් අම්මයි,වලස් තාත්තයි,පුතයි. මේ වලස් පැංචා නම් හරිම දඟයි. ඒ නිසාම වලස් පුතාට පැංචා කියලයි හැමෝම කථා කළේ.



පැංචා හරිම ආසයි කැළෑ යාළුවෝ එක්ක සෙල්ලම් කරන්න.ඒත් අම්මායි,තාත්තයි දෙන්නම පැංචාට නිති ගොඩක් දාලයි යාළුවොත් එක්ක සෙල්ලම් කරන්න යන්න දෙන්නේ.



කැළෑ යාළුවෝ එකතුවෙලා සෙල්ලම් කරන පිට්ටනිය ළඟ ලොකු ඇලක් තියෙන නිසා අම්මයි,තාත්තයි දෙන්නම පැංචාට අවවාද කරලා තියෙන්නේ ඒ ඇල ගාවට යන්න එපා කියලා



දවසක් පැංචා යාළුවෝ එක්ක සෙල්ලම් කරන්න ඇල ගාව තියෙන පිට්ටනියට ගියා. මෙහෙම සෙල්ලම් කර කරන ඉන්නකොට පැංචලාගේ බෝලේ ඇලෙන් එහා ඉවුරට ගියා දැන් ඉතින් හැමෝම බලාගෙන ඉන්නවා පැංචාටත් දැන් හරිම දුකයි.

අනේ අපි කොහොමද බෝලේ ගන්නේ දැන් අලි පැංචා කියන්න ගත්තා.



පැංචා එක පාරටම "මම ගිහින් බෝලේ අරගෙන එන්නම් "කියලා ඇලට පැනලා පිනන්න ගත්තා.



යාළුවෝ හැමෝම බයවෙලා ඉවුරට ළඟට දුවගෙන ආවා.

පැංචා ආයෙත් ගොඩට එන්න කියලා යාළුවෝ කෑගහන්න ගත්තා.



එක පාරටම වගේ පුංචි පුංචි වැහි බින්දුත් වැටෙන්න පටන් ගත්තා. පැංචා බොහෝම අමාරුවෙන් එහා ඉවුරට පීනගෙන ගියා. එතකොටම ලොකු වැස්සක් ඇදහැලෙන්න පටන් ගත්තා. ටික වේලාවකින් ඇලේ වතුර වැඩිවෙන්න පටන් ගත්තා.



දැන් යාළුවොයි පැංචායි හැමෝම ගොඩක් බයවෙලයි ඉන්නේ,

"අනේ පැංචා ඔයා කොහොමද දැන් ගොඩට එන්නෙ" කියලා හා පැංචි අඩන්න ගත්තා. යාළුවෝ ඔක්කොලාම දැන් බයේ තෙමි තෙමි පැංචා දිහා බලාගෙන ඉන්නනවා. පැංචා බයේ අඩන්න ගත්තා.



වලස් අම්මයි,තාත්තයි දෙන්නම දැන් පැංචා ගෙදර එයි කියලා මඟ බලාගෙන හිටියා . එන්න එන්නම වැස්ස තද වුණ නිසා අම්මයි තාත්තායි දෙන්නම හොඳටම බය වුණා.



අම්මයි,තාත්තායි දෙන්නම වැස්සේම තෙමි තෙමි පැංචා හොයාගෙන පිට්ටනිය පැත්තට යන්න ගියා.



අම්මයි තාත්තයි දැක්ක ඈත ඉදන්ම යාළුවෝ ටික එහා ඉවුර දිහා බලාගෙන ඉන්නවා කියලා.



අම්මයි තාත්තයි ඉක්මනට එතනට යන්න ගත්තා.

"මොකද ළමයිනේ මේ වැස්සේ තෙමි තෙමි ඉවුර ළඟට වෙලා කරන්නේ, කෝ අපේ පැංචා" කියලා වලස් අම්මා ඇහුවා..



යාළුවෝ හොඳටම බයවෙලයි දැන් ඉන්නේ අලි පැංචා අඩ අඩ අනේ නැන්දේ පැංචා බොලේ ගන්න එහා ඉවුරට ගියා. දැන් පැංචාට එන්න විදිහක් නැතිව පැංචා අඩනවා කියාලා.



මේක අහපු වලස් අම්මයි තාත්තායි හොඳටම බයවෙලා එහා ඉවුර දිහා බැලුවා.

අනේ වලස් තාත්තේ අන්න අපේ පැංචා කියලා වලස් අම්මා අඩන්න ගත්තා.



මම ගිහින් වලස් පැංචාව අරගෙන එන්නම් කියලා වලස් තාත්තා කිවුවා. වලස් තාත්තා ඇලට පැනලා බොහෝම අමාරුවෙන් පිනන්න ගත්තා.මේක දැකපු පැංචා.


"අනේ තාත්තේ එන්න එපා" කියලා පැංචා කෑගහන්න ගත්තා.



වලස් තාත්තා බොහොම අමාරුවෙන් පැංචා ඉන්න පැත්තට ළං වුණා. පැංචා ඉක්මනට තාත්තා එන පැත්තට දුවගෙන ගියා.



තාත්තා දැකපු පැංචාට හරිම සතුටුයි.



"අනේ මට සමාවෙන්න තාත්තේ," මම තාත්තයි,අම්මයි කියපු දේ ඇහුවේ නෑ කියලා පැංචා තාත්තා බදාගෙන අඬන්න ගත්තා.

වලස් තාත්තා ඇලේ වතුර ටිකක් අඩුවෙනකම් ඉදලා පැංචාත් කරේ තියාගෙන මෙහා ඉවුරට පිනනන්න පටන් ගත්තා.

වලස් පැංචයි,වලස් තාත්තයි එන දිහා හැමෝම බයේ බලාගෙන හිටියා. පැංචා ගොඩට ආව ගමන්ම "අනේ මගේ පැංචෝ "කියලා අම්මා පැංචාව තුරුල් කරගෙන අඩන්න ගත්තා.යාළුවොන්ටත් දැන් ගොඩක් සතුටුයි.පැංචාව තුරුල් කරගෙන ඉන්න අම්මා ළඟට යාළුවොත් ගිහින් පැංචාව බදාගත්තා.



වලස් පවුලයි,යාළුවෝ ටිකයි හැමෝම තම තමන්ගේ ගෙවල්වලට ගියා.



වලස් පැංචාට දැන් හරිම දුකයි. එයා අම්මයි තාත්තයි දුන් අවවාද ඇහුවේ නැති එකට.ඒත් එක්කම පැංචාට හරිම සතුටුයි පැංචා අමාරුවේ වැටුණ වෙලේ එයා එක්කම හිටිය යාළුවෝ ටික මතක් වෙනකොට.

වැඩිහිටියන් දෙන උපදෙස් පිළිපදින්න ඕන කියලා පැංචා වගේම යාළුවොත් හොඳ පාඩමක් ඉගෙන ගත්තා.

වැඩිහිටියන් දෙන අවවාද අනුශාසනා දරුවන්ට ඉතාමත් වටිනව.ඒවා පිළිපදින එක දරුවන්ගේ යුතුකමක්. පැංචා අමාරුවේ වැටෙන්නේ නෑ. පැංචා අම්මයි,තාත්තයි දෙන්නා කියපු දේ ඇහුවානම්. ඉතින් අපි හැමෝම අපේ අම්මලා තාත්තලාගේ අවවාද අනුශාසනාවට ගරු කරලා අපි හොඳ කීකරු දරුවන් වෙමු.





## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණ කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.

මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්විම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්